ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1983 අංක 42 දරන
# ලජ්නාතුල් මස්ජිදුල් ජම්යා සෙයිලන් (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ඔක්තෝබර් මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

**1983 අංක 42 දරන ලජ්නාතුල් මස්ජිදුල් ජමියා සෙයිලාන් (සංස්ථාගත කිරීමේ) පනත**

**[සහතිකය සටහන් කළේ 1982 ඔක්තෝබර් මස 17 වන දින]**

එල්. ඩී.—ඕ. 95/80

**ලජ්නාතුල් මස්ජිදුල් ජමියා සෙයිලාන් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ලජ්නාතුල් මස්ජිදුල් ජමියා සෙයිලාන් (ද සිලෝන් යුනිවසිටි මොස්ක් ඇසෝසියේෂන්)" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබුණු හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මේ දක්වා සාර්ථකව ඉටු කරනු ලැබ සහ ක්‍රියාත්මක කරනු ලැබ තිබෙන හෙයින් සහ ඒ සංගමය සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලුම් කරනු ලැබ ඇති හෙයින් සහ එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස ඉවහල් වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 42 දරන ලජ්නාතුල් මස්ජිදුල් ජමියා සෙයිලාන් (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසු, (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලජ්නාතුල් මස්ජිදුල් ජමියා සෙයිලාන් (ද සිලෝන් යුනිවසිටි මොස්ක් ඇසෝසියේෂන්) නම් සංගමයේ සාමාජිකයන්ව සිටින තැනැත්තන් හා මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් ලෙස ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් සංඛ්‍යාව "ලජ්නාතුල් මස්ජිදුල් ජමියා සෙයිලාන්" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර පොදු මුද්‍රාවක් තබාගෙන පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව, එකී නාමයෙන් සංස්ථාව විසින් සියලු අධිකරණවල නඩු පැවරීම හා සංස්ථාවට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකි ය. ලජ්නාතුල් මස්ජිදුල් ජමියා සෙයිලාන් සංස්ථාගත කිරීම.

3. (1) සංස්ථාවේ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) පේරාදෙණියේ විශ්ව විද්‍යාලය තුළ මුස්ලිම් පල්ලියක් පිහිටුවීම:

(ආ) එකී මුස්ලිම් පල්ලිය ඉදිකිරීම සඳහා සහ එය නඩත්තු කිරීම සඳහා අවශ්‍ය මුදල් එකතු කිරීම සහ ඒ සඳහා පරිත්‍යාග සහ ද්‍රව්‍ය පිළිගැනීම;

(ඇ) එකී මුස්ලිම් පල්ලිය ගොඩනැගීම සහ එය කළමනාකරණය කිරීම;

(ඈ) පේරාදෙණියේ විශ්ව විද්‍යාලයේ මුස්ලිම් සිසුන් ඉස්ලාමීය ආගමානුකූල ජීවිතයකට හැඩ ගැස්වීම හා ඔවුන්ට ආගමික උපදෙස් දීම;

(ඉ) ප්‍රජාවගේ යහපත පිණිස ඉස්ලාම් ධර්මය සහ අනුශාසනා සහ ඉස්ලාම් සංස්කෘතිය පතළ කර හැරීම සහ ඉස්ලාමීය කටයුතු නංවාලීම සහ විශේෂයෙන්, ආර්ථික පහසුකම් අඩු ශිෂ්‍යයන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම සහ ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතු වැඩි දියුණු කර ගැනීම පිණිස වෙනත් සියලු පහසුකම් සැලසීම ;

(ඊ) පුස්තකාලයක්, ප්‍රවෘත්ති සේවා හා ඒ සම්බන්ධිත පහසුකම් සහිත ඉස්ලාමීය සංස්කෘතික මධ්‍යස්ථානයක් පිහිටුවීම ; සහ

(උ) ශ්‍රී ලංකාවේ පිහිටුවනු ලබන වෙනත් විශ්ව විද්‍යාලවල සහ ආයතනවල මුස්ලිම් පල්ලි පිහිටුවීම, නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරමාර්ථ ඉටු කර ගැනීමේ දී 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ විධිවිධානවලට සංස්ථාව යටත් විය යුතු අතර, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ එකී පනත මගින් නැතහොත් ඒ යටතේ පිහිටුවන ලද අධිකාරිවල හෝ බලතලවලට හානියක් නැතහොත් ඒ බලතල කෙරෙහි බල පෑමක් (1) වන උපවගන්තියේ සඳහන් කිසිවකින් නොසිදු විය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාව සතු වූ හෝ සංස්ථාව විසින් අත්කර ගන්නා ලද හෝ අයිතිය දරන යම් ඉඩමක ගොඩනැගිලි ඉදි කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් නංවාලීම හෝ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීමේ ද, ඉටු කිරීමේ ද, ක්‍රියාත්මක කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා සේවක මණ්ඩලය සේවයේ යොදවා ගැනීමේ ද, සේවයේ නියුක්ත කර ගැනීමේ ද, සේවයෙන් පහ කිරීමේ ද බලය සංස්ථාවට තිබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු, නිලධාරීන්ගෙන් සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගත යුතු වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන වේලාවේ දී ධුර දරන සහ මේ පනතේ උපලේඛනයේ නම් සඳහන්ව තිබෙන සංගමයේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

6. (1) වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ තත් කාර්යය සඳහා විශේෂයෙන් කැඳවනු ලබන යම් රැස්වීමක දී, එකී රැස්වීමට පැමිණ, ඡන්දය දෙන සාමාජිකයන් අතුරෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයක් විසින් පහත සඳහන් සියලුම කරුණු හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් සංස්ථාව විසින් රීති සාදනු ලැබීම නීත්‍යනුකූල විය යුතු ය :— සංස්ථාවේ රීති.

(අ) සංස්ථාවේ සහ භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම සහ ඉවත් කිරීම ;

(ආ) භාරකාර මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ඇ) සාමාන්‍යයෙන් රැස්වීම් පිළිබඳ කටයුතු කිරීමේ දී සහ විශේෂයෙන්, රැස්වීම් පැවැත්වීමේ දී සංස්ථාව සහ භාරකාර මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී, සංස්ථාව විසින් සහ භාරකාර මණ්ඩලය විසින් දරනු ලබන වියදම් සංස්ථාවේ මුදල්වලින් ගෙවීම ;

(ඉ) බැංකු ගිණුම් විවෘත කිරීම සහ ඒ ගිණුම් ක්‍රියාත්මක කිරීම ;

(ඊ) සංස්ථාවේ නිලධාරීන්ගේ හෝ නියෝජිතයන්ගේ, සේවා නියුක්තයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම ;

(උ) ඉහත සඳහන් පරමාර්ථ ක්‍රියාත්මක කිරීමට ආනුෂංගික කරුණු.

(2) සංස්ථාවේ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන ආකාරයෙන් ම සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන වේලාවේ දී පවතින, සංගමයේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර සංස්ථාවට ගෙවනු ලැබිය යුතු සියලු ණය සහ දායක මුදල් සහ සහභාග මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට ගෙවනු ලැබිය යුතු ණය.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක අයිතිය දැරීමට සංස්ථාවට නීතියේ ලා හැකියාව තිබිය යුතු අතර එකී සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, ඒ දේපළවල අයිතිය මේ පනතේ කාර්යය සඳහා සහ සංස්ථාවේ තත් කාලයේ බල පවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**9.** සභාපතිවරයා හෝ උපසභාපතිවරු අතුරින් එක් උපසභාපතිවරයකු සහ ලේකම්වරයා හෝ සහකාර ලේකම්වරයා ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මඟින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ, යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ, වෙන යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

[5 (2) වන වගන්තිය]

සභාපතිවරයා : පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ගරු නියෝජ්‍ය මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍ය එම්. එච්. එම්. නයිනා මරික්කාර් මහතා, බී.ඒ., එල්.එල්.බී., (කැන්ටැබ්) බැරිස්ටර්

උපසභාපතිවරු : පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ගරු ප්‍රවාහන සේවා පිළිබඳ අමාත්‍ය සහ ගමනාගමන මණ්ඩල පිළිබඳ අමාත්‍ය එම්. එච්. මොහමඩ් මහතා
මහාචාර්ය එම්. යූ. එස්. සුල්තාන්බාවා මහතා, බී. එස්සී. (ලන්ඩන්)
ඒ. අසීස් මහතා

ලේකම්වරයා : ඒ. එච්. මාකන් මාකර් මහතා

සහකාර ලේකම්වරයා : ආචාර්ය එම්. ඒ. කරීම් මහතා, පීඑච්. ඩී.

භාණ්ඩාගාරිකවරයා : එම්. එම්. මිස්බා මහතා

සහකාර ලේකම්වරයා : එම්. සාලි ඉස්මයිල් මහතා

පාලක මණ්ඩලයේ සෙසු සාමාජිකයෝ :

අබ්දුල් ඩබ්ලිව්. එම්. අමීර් මහතා
මෙව්දූ එම්. එච්. එම්. අබ්දුල් කාදර් මහතා
අබූබකර් ඒ. එල්. ආදම්බාවා මහතා
නිහිඳ ඒ. එම්. අමීන් මහතා
මහේන්ද්‍රන් එච්. අමීන් මහතා
අස්හර් ගෆූර් මහතා

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කථානායක එම්. අබ්දුල් බාකීර් මාකාර් මහතා

වෛද්‍ය කේ. වී. ඒ. බාවාජා මහතා, යූ. එන්. ඩී. පී.

සාමදාන විනිශ්චයකාර ඒ. එල්. එම්. ෆාරුක් මහතා

ඒ. එල්. එම්. හසීම් මහතා, බැරිස්ටර්

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විදේශ අමාත්‍ය ඒ. සී. එස්. හමීඩ් මහතා

ආචාර්ය එස්. ඒ. ඉමාම් මහතා, පීඑච්.ඩී. (බොන්)

ඉංජිනේරු එම්. ඉස්මයිල් මහතා

එස්. එස්. ඉසඩීන් මහතා

එම්. එස්. ඉසඩීන් මහතා

පාර්ලිමේන්තු මන්ත්‍රී ජබීර් ඒ. කාදර් මහතා

ආචාර්ය එම්. එම්. එම්. ජමීල් මහතා, පීඑච්. ඩී.

වෛද්‍ය එම්. ඊ. එම්. කලීල් මහතා

එම්. එච්. එම්. කමිල් මහතා

සාමදාන විනිශ්චයකාර ඒ. එල්. එම්. ලෆීර් මහතා

ඒ. අයි. එල්. මරික්කාර් මහතා

වෛද්‍ය එම්. එම්. මාරූෆ් මහතා

නීතිඥ එස්. එම්. මුස්තාපා මහතා

ජේ. එම්. මොහමඩ් රාජි මහතා, බී. ඒ. (ලංකා)

කොමිෂ්පල් එස්. ජබීර් මහතා

මස්තු විදානෙ එම්. ජේ. ඒ. රහීම් මහතා

වෛද්‍ය එම්. එස්. එම්. රිෆායි මහතා

අල්හාජ් පී. ඒ. සදාක් මහතා

අයි. ඒ. සලාම් මහතා

වෛද්‍ය ඒ. සමාද් ඉස්මයිල් මහතා

නීතිඥ ඒ. එච්. එල්. ඒ. සලීම් මහතා

එම්. ඒ. සත්ගානි මහතා

එස්. එල්. එම්. ෂාෆි මරික්කාර් මහතා, බී.ඒ. (ලන්ඩන්)

තව්ෆීක් මූක්කාර් මහතා

ආචාර්ය එම්. අයි. එම්. වසීර් මහතා, පීඑච්.ඩී.

සාමදාන විනිශ්චයකාර එම්. ෂේන් මහතා

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.